පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය
**6**

# දෙවන වාර පරීක්ෂණය - 2019

පාසලේ නම : ......................................................................................

ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ නම/ ඇතුළත්වීමේ අංකය : ................................................
......................................................................................

කාලය : පැය 02 යි.

# පුරවැසි අධ්‍යාපනය I, II

## පුරවැසි අධ්‍යාපනය I

**සැලකිය යුතුයි :**

❖ **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

- **අංක 01 - 05 දක්වා ප්‍රශ්නවල ප්‍රකාශයන්ට වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. පාසලේ ඉතිහාසය පිළිබඳ තොරතුරු සොයාගත හැකි වැදගත්ම මූලාශ්‍රයකි.
(1) පංතිභාර ගුරුතුමිය (2) පංති නායිකාව
(3) ලොග් සටහන් පොත (4) යාබද විදුහලේ විදුහල්පති

02. පාසලේ පරිපාලනයට සම්බන්ධ ප්‍රධාන තනතුර වන්නේ,
(1) විදුහල්පතිතුමා (2) අධ්‍යක්ෂතුමා
(3) අංශ ප්‍රධාන (4) සහකාර විදුහල්පති

03. ඔබගේ වයස නිවැරදි බව තහවුරු කරගත හැකි වන්නේ,
(1) පියාගෙන් (2) මවගෙන්
(3) භාරකරුගෙන් (4) උප්පැන්න සහතිකයෙන්

04. ඔබ සතු දුබලතාවයක් **නොවන්නේ,**
(1) අවංක වීම (2) බොරු කීම
(3) කේලාම් කීම (4) අලසකම

05. ශ්‍රී ලංකාවේ කුඩාම පරිපාලන ඒකකය කුමක් ද?
(1) නිවස (2) ග්‍රාම නිළධාරි කොට්ඨාසය
(3) පළාත (4) දිස්ත්‍රික්කය

Education NCP - www.edncp.lk

- **අංක 06 - 10 දක්වා ප්‍රකාශවලට ගැළපෙන පිළිතුරු වරහන තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

(දිස්ත්‍රික් ලේකම් / සභාපති / නගරාධිපති / ජීවිත අරමුණු / උතුරු / නිළ ඇඳුම / දකුණු)

06. ඔබට පහසු දේවල් තෝරා බේරා ගැනීමෙන් ඔබේ හැකියා දක්ෂතා මත ........................................................................ ගොඩ නගාගත හැකි ය.

07. පාසල් සංස්කෘතිය විදහා දැක්වෙන සංස්කෘතිකාංගයක් ලෙස ........................................................................ වැදගත් වේ.

08. දිස්ත්‍රික්ක 05 ක් දක්නට ලැබෙන පළාත ........................................................................ පළාතයි.

09. නගර සභාවක ප්‍රධානියා ලෙස ........................................................................ කටයුතු කරයි.

10. දිස්ත්‍රික්කයක ප්‍රධානියා ........................................................................ වේ.

- **අංක 11 - 15 දක්වා ප්‍රකාශවල ඒ ඒ ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.**

11. සෑම පුරවැසියෙකුටම අනන්‍යතාවයක් තිබේ. ( )
12. තම දුර්වලතා අන් අය පෙන්වා දුන් විට ඒවා විවේචනය කළ යුතුයි. ( )
13. පාසලක දැක්ම යනු පාසල අනාගතයේ දී ඉටු කරගැනීමට බලාපොරොත්තු වන අරමුණුයි. ( )
14. ප්‍රජාවගෙන් ලබාගත හැකි භෞතික සම්පත් පාසල් සංවර්ධනයට යොදා ගැනේ. ( )
15. දවසේ පැය 12 ක් පමණක් ජනතාවට සේවා සපයන ආයතනයක් ලෙස රෝහල හැඳින්විය හැක. ( )

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්නවල (අ) තීරුවට ගැළපෙන පිළිතුරු (ආ) තීරුවෙන් තෝරා එහි අක්ෂරය වරහන තුළ යොදන්න.**

| | (අ) | | | (ආ) |
|---|---|---|---|---|
| 16. | ග්‍රාම නිළධාරි | ( ) | (a) | 25 |
| 17. | අනධ්‍යයන කාර්ය මණ්ඩලය | ( ) | (b) | 22 |
| 18. | සැලසුම්කරණයේ වාසියකි | ( ) | (c) | ගැටලු අවම වෙයි |
| 19. | සාමූහික ක්‍රියාකාරකමකි | ( ) | (d) | රජයේ සහනාධාර බෙදීම |
| 20. | ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්ක | ( ) | (e) | ආරක්ෂක කටයුතුවලට සහාය වීම |
| | | | (f) | ගොයම් සිටුවීම |
| | | | (g) | දිනපතා පාසල් පැමිණීම |

(ලකුණු 2 × 20 = 40)

Education NCP - www.edncp.lk

## පුරවැසි අධ්‍යාපනය II

❖ **පහත සඳහන් ප්‍රශ්න වලින් ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. (i) පාසලේ ඉතිහාසය යනු කුමක් ද?
    (ii) ඔබේ පාසලේ සංවිධාන ව්‍යුහය ඇඳ දක්වන්න.
    (iii) පාසලේ සිටින ගුරුවර ගුරුවරියන්ගෙන් ඉටු විය යුතු වගකීම් 05 ක් ලියන්න.

02. (i) ඔබ සතු හොඳ ගතිලක්ෂණ තුනක් ලියන්න.
    (ii) (අ) ශ්‍රී ලංකාවේ මුල්ම අධ්‍යාපන අමාත්‍යවරයා කවුරුන් ද?
    (ආ) ශ්‍රී ලංකාවේ ඖෂධවේදය පිළිබඳ ප්‍රථම මහාචාර්යවරයා කවුරුන්දැයි නම් කරන්න.
    (iii) පුද්ගලයකු සතු හැකියා දක්ෂතා වැඩි දියුණු කරගැනීමට යොදාගත හැකි ක්‍රමවේද 05 ක් ලියන්න.

03. (i) ඔබේ පාසලේ ආදර්ශ පාඨය ලියන්න.
    (ii) පාසල් ලාංඡනය භාවිතා කරන අවස්ථා 04 ක් ලියන්න.
    (iii) පාසලක ළමයින් සම්බන්ධයෙන් පවතින පොදු නීතිරීති 05 ක් ලියන්න.

04. (i) පාසල් ගීතයෙන් ඉටුවන මෙහෙවර කරුණු තුනකින් ප්‍රකාශ කරන්න.
    (ii) ගුරු මණ්ඩලය වෙනුවෙන් ඔබෙන් ඉටු විය යුතු යුතුකම් 04 ක් නම් කරන්න.
    (iii) පාසල තුළ ඔබේ හැකියාවන් වර්ධනය කරගැනීමටත් අයිතීන් ආරක්ෂා කරගැනීමටත් රජය විසින් ඔබට සපයා ඇති පහසුකම් පහක් පෙන්වා දෙන්න.

05. (i) පාසල විසින් අවට ප්‍රජාවට ලබාදෙන පණිවිඩ තුනක් ලියා දක්වන්න.
    (ii) පාසල් සංවර්ධන කමිටුවේ සාමාජිකත්වය ලබාගත හැකි පුද්ගලයන් හතරදෙනෙකු නම් කරන්න.
    (iii) ළමා මිතුරු පාසල් පරිසරයක හඳුනාගත හැකි ලක්ෂණ 05 ක් ලියන්න.

06. (i) මධ්‍යම පළාතට අයත් දිස්ත්‍රික්ක තුන නම් කරන්න.
    (ii) සාමූහිකත්වයෙන් අපට ලැබෙන ප්‍රයෝජන හතරක් පෙන්වා දෙන්න.
    (iii) භෞතික සම්පත් සංරක්ෂණයට ගත හැකි ක්‍රියාමාර්ග පහක් ලියන්න.

07. (i) ගොවි සමිතියකින් සිදුවන සේවාවන් තුනක් ලියන්න.
    (ii) සිද්ධස්ථාන මඟින් සිදුවන සේවාවන් හතරක් පෙන්වා දෙන්න.
    (iii) අපට සේවා සපයන ආයතනවලින් ඉටුවිය යුතු යුතුකම් පහක් ලියා දක්වන්න.

(ලකුණු 3 + 4 + 5 = 12)

(ලකුණු 12 × 5 = 60)

***

Education NCP - www.edncp.lk
PAST PAPERS WIKI

## පුරවැසි අධ්‍යාපනය I, II

6 ශ්‍රේණිය | දෙවන වාර පරීක්ෂණය - 2019

## පුරවැසි අධ්‍යාපනය I
## ලකුණු දීමේ පටිපාටිය

| | | | |
|---|---|---|---|
| 01 | (2) | ලොග් සටහන් පොත | |
| 02 | (1) | විදුහල්පතිතුමා | |
| 03 | (4) | උප්පැන්න සහතිකය | |
| 04 | (1) | අවංක වීම | |
| 05 | (2) | ග්‍රාම නිලධාරී කොට්ඨාසය | |
| 06 | ජීවිත අරමුණු | | |
| 07 | නිල ඇඳුම | | |
| 08 | උතුරු | | |
| 09 | සභාපති | | |
| 10 | දිස්ත්‍රික් ලේකම් | | |
| 11 | ✓ | | |
| 12 | × | | |
| 13 | ✓ | | |
| 14 | ✓ | | |
| 15 | × | | |
| 16 | රජයේ සහනාධාර බෙදීම. | | (e) |
| 17 | ආරක්ෂක කටයුතුවලට සහාය වීම. | | (f) |
| 18 | ගැටලු අවම වෙයි. | | (c) |
| 19 | ගොයම් සිටුවීම. | | (g) |
| 20 | 25 | | (a) |

## පුරවැසි අධ්‍යාපනය II

## ලකුණු දීමේ පටිපාටිය

01. (i) පාසලේ ඉතිහාසය යනුවෙන් අදහස් කරන්නේ පාසල ආරම්භ වූ දා සිට මේ දක්වා විකාශනය වූ ආකාරය පිළිබඳ තොරතුරුය.

(ii) පාසලට අදාළ පරිදි ලකුණු දෙන්න.

(iii)
- ★ පාසල් පාදක ඇගයීම් සිදු කිරීම.
- ★ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සමානාත්මතාවයෙන් සැලකීම.
- ★ පාසල් වාර පරීක්ෂණ පවත්වා ලකුණු ලබා දීම. (පිටු අංක 8)

02. (i)
- ★ කාරුණිකයි
- ★ සත්‍යවාදියි
- ★ අවංකයි (පිටු අංක 14)

(ii) (අ) ආචාර්ය සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මැතිතුමා.

(ආ) සේනක බිබිලේ මහතා.

(iii)
- ★ තමන්ට කළ හැකි, තමන් කැමති දේ හඳුනා ගෙන, වඩාත් හොඳින් කිරීම.
- ★ ඔබ තුළ ඇති දක්ෂතාවයන් අවස්ථානුකූලව පෙන්වීම තුළින් ඔබ තුළ ආත්ම විශ්වාසය ගොඩනගා ගැනීම.
- ★ තමන්ගේ දක්ෂතා සමාජයේ දියුණුවට වැදගත් බව තේරුම් ගෙන ඒවා වර්ධනය කර ගැනීම.

(පිටු අංක 19)

03. (i)

(ii)
- ★ පාසල් නිල ඇඳුම සමග
- ★ පාසලෙන් නිකුත් කරන ලිපි ලේඛනවලය
- ★ පාසලේ අනන්‍යතාව ඇගවීම සඳහා (පිටු අංක 31)

(iii)
- ★ දිනපතා පාසලට පැමිණීම.
- ★ නායකත්වයට අවනත වීම.
- ★ පවතින සම්ප්‍රදායන් ආරක්ෂා කිරීම. (පිටු අංක 19)

04. (i)
- ★ පාසලෙන් ජාතියට සිදුවන මෙහෙය පිළිබඳ සිතිවිලි ළමයින් තුළ ජනිත කිරීම.
- ★ ළමයින් තුළ තම පාසල පිළිබඳ ගෞරවය, අභිමානය හා ආදරය ඇති වීම.
- ★ පාසලේ අනන්‍යතාව පිළිබිඹු වීම.

(ii) ★ හොඳින් ඉගෙනීමේ කටයුතුවල යෙදීම.
★ ආචාරශීලී වීම.
★ ගරු කිරීම හා කීකරු වීම. (පිටු අංක 38)

(iii) ★ නොමිලයේ අධ්‍යාපනය ලබා දීම.
★ නොමිලයේ පාසල් පොත් ලබා දීම.
★ භාෂාගාර පිහිටු වීම. (පිටු අංක 36)

05. (i) ★ දරුවන් පාසල් යැවීමේ වැදගත්කම.
★ යහපත් සිරිත් විරිත් පිළිපැදීම.
★ පරිසරය රැක ගැනීමේ වැදගත්කම. (පිටු අංක 41)

(ii) ★ දෙමාපිය නියෝජිතයන්
★ ආදි ශිෂ්‍ය නියෝජිතයන්
★ ආචාර්ය මණ්ඩලයේ නියෝජිතයන්
★ කලාප අධ්‍යාපන කාර්යාලයේ නියෝජිතයෙක් (පිටු අංක 42)

(iii) ★ ජලය හා සෞඛ්‍යාරක්ෂිත පහසුකම් සපයා ඇත.
★ සුරක්ෂිත ඉගෙනුම් පරිසරයක් ඇත.
★ ප්‍රබෝධමත් පංති කාමර පරිසරයක් ඇත. (පිටු අංක 45)

06. (i) ★ මහනුවර
★ මාතලේ
★ නුවරඑළිය

(ii) ★ සුහදත්වය
★ වින්දනය
★ පහසුව (පිටු අංක 61)

(iii) ★ වනාන්තර සුරැකීම.
★ විකල්ප ද්‍රව්‍ය භාවිතය.
★ පාංශු සංරක්ෂණය. (පිටු අංක 56)

07. (i) ★ උපදෙස් සැපයීම.
★ සහනාධාර ලබා දීම.
★ සුභ සාධක සේවා සැපයීම. (පිටු අංක 69)

(ii) ★ දහම් දැනුම ලබා දීම.
★ අවවාද අනුශාසනා ලබා දීම.
★ ජනවර්ග අතර සමගිය ඇති කිරීම. (පිටු අංක 67)

(iii) ★ තම සේවාවන් නිසි අයුරින් ලබා ගැනීම.
★ කාර්යක්ෂම ව කටයුතු කිරීම.
★ නිවැරදි උපදෙස් හා මඟ පෙන්වීම් ලබා දීම. (පිටු අංක 69)

PAST PAPERS WIKI


LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
G.C.E. O/L
විද්‍යාව
A9+
ඉංග්‍රීසි භාෂාව
ENGLISH LANGUAGE
සිංහල
G.C.E. O/L SINHALA
General English
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON DELIVERY
HOME DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440